// The national emblem and the QR code are logos/barcodes — not added

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2209/14 - 2021 ජනවාරි මස 04 සඳුදා - 2021.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක 2187/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2021 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2021 ජනවාරි මස 04 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

(1) එම නිවේදනයේ අංක "9.3 නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "02. සුවිශේෂී ප්‍රමුඛතා" යටතේ පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

02. සුවිශේෂී ප්‍රමුඛතා

16. කාර්මික විද්‍යාල, තාක්ෂණික විශ්වවිද්‍යාල හා ඒ යටතේ වන ආයතනික ව්‍යුහයන් අධ්‍යයනය කොට පවත්නා භෞතික සම්පත් වැඩි දියුණු කිරීමට ප්‍රමුඛත්වය දෙමින්, අදාළ දිස්ත්‍රික්කයේ, නිෂ්පාදන අංශවලට අවශ්‍ය නිපුණතා වර්ධනය කරමින්, රැකියා අවස්ථාවන්ට අවශ්‍ය උපාධි මට්ටමේ උසස් අධ්‍යාපන ආයතන ලෙස නගර විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කිරීම.

17. 2019 අංක 22 දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන පනතට අනුකූලව ජාතික නවෝත්පාදන ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

18. සාර්ථක ව්‍යවසායකත්වයක් හා ආදයම් උත්පාදන මෙවලමක් ලෙස වෘත්තීය තාක්ෂණ අධ්‍යාපනයේ විභවතාවය ප්‍රචලිත කරමින්, එය ජනතාවට සමීප කිරීමටත්, දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි වෘත්තීය අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථා විවෘත කිරීමත් පිණිස ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා හඳුන්වා දීම.

01 -265